ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත

[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2006 මැයි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 16.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත

[සහතිකය සටහන් කළේ 2006 මැයි මස 19 වන දින]

එල්. ඩී. —ඕ. 8/2004.

ශ්‍රී ලංකාව තුළ දී ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වූ ගිවිසුම් සකස් කර ගැනීම සඳහා ද : දත්ත පණිවුඩ නිර්මාණය සහ හුවමාරුව හා වෙනත් සන්නිවේදන පිළිගැනීම හා ඊට පහසුකම් සැලසීම සඳහා ද : සහතික කිරීමේ බලාධිකාරයක් පත් කිරීම සඳහා ද : සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් ප්‍රතිතනය සඳහා ද : ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන, මේ පනත පාර්ලිමේන්තු පනතක් ලෙස සහතික කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන අතර, අනෙකුත් විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන ) දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

## I වන පරිච්ඡේදය

## පොදු විධිවිධාන

2. මේ පනතේ පරමාර්ථ වන්නේ – පනතේ පරමාර්ථ.

(අ) නෛතික අවහිරතා තුරන් කිරීම සහ නෛතික නිශ්චිතතාව තහවුරු කිරීම මගින් දේශීය හා ජාත්‍යන්තර ඉලෙක්ට්‍රොනික වාණිජ කටයුතු සඳහා පහසුකම් සැලසීම ;

(ආ) විශ්වසනීය ඉලෙක්ට්‍රොනික වාණිජ ක්‍රියාමාර්ග භාවිතයට ගැනීම දිරිමත් කිරීම ;

(ඇ) ආණ්ඩුව වෙත ලේඛන ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම සඳහා පහසුකම් සැලසීම සහ විශ්වසනීය ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ක්‍රම මගින් ආණ්ඩුවේ සේවා කාර්යක්ෂමව සැපයීම ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඈ) දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හා වෙනත් සන්නිවේදනවල සත්‍යවත්භාවය, අවංකභාවය හා විශ්වසනීයත්වය කෙරෙහි මහජන විශ්වාසය ප්‍රවර්ධනය කිරීම,

වේ.

## II වන පරිච්ඡේදය

## ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන දත්ත පණිවුඩ සහ වෙනත් සන්නිවේදන පිළිගැනීම

ඉලෙක්ට්‍රොනික වාර්තා පිළිබඳ නෛතික පිළිගැනීම.

**3**. ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් තිබීමේ හේතුව මත කිසිම දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් පිළිබඳ පිළිගැනීම, එහි බලපෑම, වලංගුභාවය හෝ එය බලාත්මක කිරීමේ හැකියාව අහිමි නොකළ යුතු ය.

ලිඛිතව පැවතීමේ අවශ්‍යතාවය.

**4**. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බලපවත්නා ලිඛිත නීතිවල විධිවිධානවලින් ඇතැම් සාධනපත්‍ර ලිඛිතව සකස් කරනු ලැබ ඇත්නම් පමණක් එම සාධනපත්‍රවලට නෛතික වලංගුභාවය ආරෝපණය කරනු ලැබුව ද, එය නොතකා, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වූ යම් දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් සන්නිවේදනයක අන්තර්ගත තොරතුරු පසු අවස්ථාවක දී යොමු වී භාවිත කළ හැකි පරිදි එම තොරතුරුවලට ප්‍රවේශ විය හැකි නම්, ඒවා ලිඛිතව සකස් කරනු ලැබීමේ අවශ්‍යතාවය සපුරා ඇති ලෙස සැලකිය යුතු ය.

මුල් ආකෘතියේ පැවතීමේ අවශ්‍යතාවය.

**5**. (1) තොරතුරු මුල් ආකෘතියෙහි ම ඉදිරිපත් කළ යුතු බවට හෝ තබා ගත යුතු බවට නීතියෙන් නියම කර ඇති අවස්ථාවක දී, දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් සන්නිවේදනයක අවංකභාවය පිළිබඳ විශ්වසනීය තහවුරුවක්, එය ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් ලබාගත හැකි වූ වේලාවේ සිට පැවතියේ නම් සහ එම දත්ත පණිවුඩයේ, ඉලෙක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ අන්තර්ගත තොරතුරු ලබාගත හැකි නම් සහ එම තොරතුරු පසු අවස්ථාවක දී යොමු වී භාවිත කළ හැකි නම් ඒ පණිවුඩය හෝ සන්නිවේදනය ඉහත සඳහන් නියමය සපුරා ඇති ලෙස සැලකිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා –

(අ) එම තොරතුරුවලට යම් පිටසනක් එකතු කිරීම හෝ සාමාන්‍ය සන්නිවේදන ක්‍රියාවලියේ දී හෝ එම තොරතුරු ගබඩා කර තැබීමේ දී හෝ සංදර්ශනය කිරීමේ දී හෝ අවශ්‍ය වන යම්

වෙනස් කිරීම් හැර සම්පූර්ණයෙන් හා නොවෙනස්ව පවතින්නේ ද යන කාරණය අදාළ තොරතුරුවල අවංකභාවය තක්සේරු කිරීමේ උපමානය විය යුතු ය ;

(ආ) අදාළ තොරතුරු ජනනය වූයේ කවර කාර්යයක් සඳහා ද යන කාරණය සහ ඊට අදාළ වෙනත් සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන, ඉහත කී තහවුරුවේ විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රමිතිය තක්සේරු කළ යුතු ය.

සුරක්ෂිතව රඳවා තබාගැනීමේ අවශ්‍යතාවය.

**6**. කිසියම් තොරතුරු සුරක්ෂිතව රඳවා තබාගත යුතු බවට යම් නීතියක පවත්නා නියමයක්, එම දත්ත පණිවුඩයේ, ඉලෙක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ තොරතුරු ආරම්භයේ දී ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් ජනනය නොවුව ද, එම තොරතුරු ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් සුරක්ෂිතව තබාගැනීම—

(අ) එම දත්ත පණිවුඩයේ, ඉලෙක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ තොරතුරු භාවිතයට ගත හැකි සේ පසු අවස්ථාවල දී යොමුවීම සඳහා ප්‍රවේශ විය හැකි පරිදි පවතින්නේ නම් ;

(ආ) එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ජනනය වූ, යවන ලද හෝ එවන ලද ආකෘතියෙහි හෝ ජනනය වූ, යවන ලද හෝ එවනු ලබන තොරතුරු නිවැරදිව ඉදිරිපත් වන පරිදි දැක්වීමට හැකි ආකෘතියක සුරක්ෂිතව රඳවා තබා ඇත්නම් ; සහ

(ඇ) එම දත්ත පණිවුඩයේ, ඉලෙක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ ජනනය සහ ගමනාන්තයට යවනු ලැබූ හෝ ලැබුණු දිනය හා වේලාව ද තිබේ නම්, ඒවා දැනගැනීමට හැකියාව ලැබෙන පරිදි එම තොරතුරු සුරක්ෂිත කර තිබේ නම්,

එම නියමයන් සපුරා ඇත්තාක් සේ සැලකිය යුතු ය :

එසේ වුව ද, හුදෙක් ම ඉලෙක්ට්‍රොනික වාර්තාවක් යැවීම හෝ ලැබීම කිරීමට හැකිවීම සඳහා, ස්වයංක්‍රීයව උත්පාදනය වන යම් තොරතුරුවලට මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

ඉලෙක්ට්‍රොනික අත්සන් සඳහා නෛතික පිළිගැනීම.

**7**. යම් තොරතුරක් හෝ සන්නිවේදනයක් යම් තැනැත්තකුගේ අත්සන යොදා සත්‍ය බවට සහතික කළ යුතු බවට හෝ යම් ලේඛනයක් යම් තැනැත්තකු විසින් අත්සන් කළ යුතු බවට හෝ ඒ ලේඛනයක යම් තැනැත්තකුගේ අත්සන තිබිය යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විවිධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක, ඒ නීතියේ

විධිවිධාන එසේ සඳහන්ව තිබුණ ද, එම තොරතුර හෝ කාරණය ඉලෙක්ට්‍රොනික අත්සනක් මගින් සත්‍යවත් භාවය සහතික කර තිබේනම්, එම විධිවිධාන සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.

*පැහැදිලි කිරීම* – මේ වගන්තියේ කාර්ය සඳහා අත්සන් කිරීම යන යෙදුම එහි ව්‍යාකරණානුකූල ප්‍රභේද සහ සජාතීය යෙදුම් යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, යම් ලේඛනයක ඔහුගේ අත් අකුරින් අත්සන යෙදීම හෝ යම් ලකුණක් යෙදීම අදහස් වන අතර, “අත්සන ” යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය.

රජයේ ආයතනවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල ඉලෙක්ට්‍රොනික වාර්තා සහ ඉලෙක්ට්‍රොනික අත්සන් යොදා ගැනීම.

8. (1) තත්කාලීනව බලපවත්නා ලිඛිත නීතියක් මගින් –

(අ) කවර හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, කාර්යාලයකට, පුද්ගල මණ්ඩලයකට හෝ ආණ්ඩුවට අයත් හෝ ආණ්ඩුව විසින් පාලනය කරනු ලබන නියෝජිත ආයතනයකට හෝ ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලයකට යම් ආකෘති පත්‍රයක්, ඉල්ලුම් පත්‍රයක් හෝ වෙනත් යම් ලේඛනයක් යම් විශේෂිත ආකාරයකින් ගොනු කිරීමට ;

(ආ) යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ අනුමතයක් නිකුත් කිරීමට ;

(ඇ) යම් ගෙවීමක්, සපයා ගැනීමක් හෝ වෙනත් ගනුදෙනුවක් යම් විශේෂිත ආකාරයකින් සිදු කිරීමට,

නියමිතව ඇති අවස්ථාවක, තත්කාලීනව බලපවත්නා වෙනත් යම් නීතියක ඊට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, අවස්ථාවෝචිත පරිදි, ඒ ගොනු කිරීම, නිර්මාණය, සුරක්ෂිතව රඳවා තබා ගැනීම, නිකුත් කිරීම, ප්‍රදානය කිරීම, ලැබීම, ගෙවීම, සපයාගැනීම හෝ ගනුදෙනු කිරීම, අදාළ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ආයතනය, ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලය හෝ රාජ්‍ය සංස්ථාව නැතහොත් වෙනත් ඒ හා සමාන පුද්ගල මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි වූ ඉලෙක්ට්‍රොනික වාර්තා ස්වරූපයෙන් සිදු කර ඇත්නම් එය එකී නියමයන් සපුරා ඇත්තාක් සේ සැලකිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ඉලෙක්ට්‍රොනික වාර්තා පාවිච්චි කරන ලෙස නියම කරන අදාළ

බලධරයා විසින් දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන. ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් සන්නිවේදන භාවිතා කිරීමට බලය දෙන හෝ පහසුකම් සැලසීමේ කාර්යය සඳහා පහත දැක්වෙන කරුණු නිශ්චය කරන නියෝග හෝ රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) එම ඉලෙක්ට්‍රොනික වාර්තා ගොනු කළ යුතු, නිර්මාණය කළ යුතු, සුරක්ෂිතව තබා ගත යුතු හෝ නිකුත් කළ යුතු ආකාරය සහ එහි ආකෘතිය ;

(ආ) එම ඉලෙක්ට්‍රොනික ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවලට අත්සන් කළ යුතු අවස්ථාවල දී, අවශ්‍ය ඉලෙක්ට්‍රොනික අත්සනේ ස්වභාවය ;

(ඇ) එම ඉලෙක්ට්‍රොනික අත්සන ඉලෙක්ට්‍රොනික ලේඛනයට හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවට තැබිය යුතු ආකාරය හා එහි ආකෘතිය සහ එම ලේඛනය ගොනු කරන තැනැත්තා යොදාගත යුතු සහතික කිරීමේ බලධරයාගේ හෝ සහතික සේවා සැපයුම්කරුගේ අනන්‍යතාවය හෝ ඒ සහතික කිරීමේ බලධරයා හෝ සැපයුම්කරු සතුව තිබිය යුතු උපමාන ;

(ඈ) ඉලෙක්ට්‍රොනික ලේඛන, වාර්තා, සපයා ගැනීම්, ගනුදෙනු හෝ ගෙවීම්වල රහස්‍යභාවය, සත්‍යවත් භාවය සහ, හෝ අවංකභාවය ආරක්ෂා කර ගැනීම පිණිස අවශ්‍ය පාලන ක්‍රියාවලිය සහ ක්‍රියා මාර්ග ;

(ඉ) (අ) ඡේදය යටතේ යම් ඉලෙක්ට්‍රොනික වාර්තා ගොනු කිරීම, නිර්මාණය, සුරක්ෂිත තබා ගැනීම හෝ නිකුත් කිරීම සඳහා යම් ගාස්තු හෝ අයකිරීම් ගෙවිය යුතු ආකාරය හා ක්‍රමය ;

(ඊ) එකී යම් විධිවිධානයක් යටතේ කරනු ලැබීමට නියමිත යම් දෙයක් කරනු ලැබිය යුතු හෝ ලේඛනයක්, දැන්වීමක් හෝ සාධනපත්‍රයක් උපයෝගී කර ගැනීමෙන් ලියවිල්ලක් මගින් හෝ අන්‍යාකාරයකින් ඊට සාක්ෂි පෙන්නුම් කළ යුතු ආකාරය ;

(උ) එකී යම් විධිවිධානයක් යටතේ කරනු ලැබීමට නියමිත යම් කිසිවක් තැපැල් මගින් නැතහොත් නිශ්චිතව සඳහන් කරනු ලබන භාරදීමේ වෙනත් උපක්‍රමයක් මගින් කරනු ලැබිය යුතු ආකාරය ;

(ඍ) යම් තැනැත්තකුගේ අත්සනින් හෝ මුද්‍රාවෙන් බලය දිය යුතු හෝ දෙනු ලැබිය හැකි බවට ඒ යම් විධිවිධාන යටතේ නියමිත කිසිවක් කිරීම ;

(එ) දිවුරුම් පිට කළ යුතු බවට ඒ යම් විධිවිධානයක් යටතේ නියමිත යම් ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක් කිරීම ;

(ඒ) ඒ යම් විධිවිධානයක් යටතේ කරනු ලැබිය යුතු හෝ කරනු ලැබිය හැකි යම් ගෙවීමක් කිරීම ;

(ඔ) ඉලෙක්ට්‍රොනික වාර්තා පිළිබඳව හෝ වර්තමානයේ කඩදාසියෙන් වන අනුරූප ලේඛන සඳහා දැනට නියමිත ගෙවීම් පිළිබඳ වූ වෙනත් යම් කාරණ.

ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් යනාදියෙහි පළකිරීම නිසි පළකිරීමක් ලෙස සැලකෙන බව.

**9**. යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රානික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.

වාර්තාවක්, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් විය යුතු යයි බල කිරීමට අයිතියක් නොමැති බව.

**10**. යම් ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තා ආකාරයෙන් භාරගත යුතු බවට හෝ නිකුත් කළ යුතු බවට හෝ යම් ගනුදෙනුවක් ඉලෙක්ට්‍රානිකව සිදු කළ යුතු බවට යම් අමාත්‍යාංශයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, ආයතනයකට, ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලයකට හෝ රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් ඒ සමාන පුද්ගල මණ්ඩලයකට බලකර ඉල්ලා සිටීම, මෙහි මීට ඉහතින් වූ විධිවිධානවල අන්තර්ගත කිසිවකින් යම් තැනැත්තකුට අයිතිවාසිකමක් නොපැවරෙන්නේ ය.

## III වන පරිච්ඡේදය

## ඉලෙක්ට්‍රොනික ගිවිසුම්

ඉලෙක්ට්‍රොනික ගිවිසුම්.

**11**. ගිවිසුම් සකස් කර ගැනීමේ දී ගිවිසුමේ සන්දර්භයෙහි පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරව එකඟවනු ලැබුවහොත් මිස, අර්පණයක් සහ අර්පණයක් ප්‍රතිග්‍රහණය කිරීම, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. ගිවිසුමක් හුදෙක් ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් තිබීමේ හේතුව මත එහි වලංගුභාවය හෝ එය බලාත්මක කිරීමේ හැකියාව ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

ඉලෙක්ට්‍රොනික වාර්තා ආරෝපණය කිරීම.

12. (1) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟවීමක් ඇත්නම් මිස, යම් දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක්–

(අ) එහි මූලාරම්භක විසින් ම යවනු ලැබුවේ නම් ;

(ආ) ඒ දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය සම්බන්ධයෙන් මූලාරම්භක සඳහා සහ වෙනුවට ක්‍රියා කිරීමට බලයලත් තැනැත්තකු විසින් යවනු ලැබුවේ නම් ; හෝ

(ඇ) මූලාරම්භක විසින් හෝ වෙනුවෙන් කරන ලද ස්වයංක්‍රීය තොරතුරු සන්නිවේදන පද්ධතියක් මගින් යවනු ලැබුවේ නම්,

එය මූලාරම්භක විසින් ම යවනු ලැබූ දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලෙස සැලකිය යුතු ය.

(2) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟවීමක් ඇත්නම් මිස, දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් සන්නිවේදනයක මූලාරම්භකගේ දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලෙස එහි ලිපිනය හිමිකරු විසින් සලකනු ලැබිය යුතු අතර –

(අ) එම දත්ත පණිවුඩයේ, ඉලෙක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ සත්‍යවත් භාවය පිළිබඳව සැක කිරීමට ලිපිනය හිමිකරුට හේතුවක් නොමැතිනම් ; හෝ

(ආ) එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය සත්‍යවත් නොවන ලෙස සැලකීමට, ලිපිනය හිමිකරු දන්නා වූ හෝ යුක්තිසහගත ප්‍රවේසමකින් කටයුතු කරන ලද නම් ලිපිනය හිමිකරු විසින් දැනගත යුතුව තිබුණු අවස්ථාගත කරුණු කිසිවක් නොපවතින්නේ නම්,

එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රානික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්ථාව හෝ වෙනත් සන්නිවේදනය එහි මූලාරම්භකගේ දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ය යන පූර්ව නිගමනය මත ක්‍රියා කිරීමට ලිපිනය හිමිකරුට හිමිකම ඇත්තේ ය.

හාරගත් බව දැනුම්දීම.

**13**. (1) දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් භාරගත් බව කිසියම් විශේෂිත ආකාරයකින් හෝ කිසියම් විශේෂිත ක්‍රමයකින් දැනුම් දිය යුතු බවට මූලාරම්භක එහි ලිපිනය හිමිකරු සමඟ එකඟත්වයකට පැමිණ නොමැති අවස්ථාවක, දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් භාරගත් බව –

(අ) ලිපිනය හිමිකරු විසින් යම් ස්වයංක්‍රිය හෝ අන්‍යාකාර යම් දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් මගින් ; හෝ

(ආ) දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය භාරගෙන ඇති බව මූලාරම්භකට පෙන්නුම් කිරීමට ප්‍රමාණවත් පරිදි වූ ලිපිනය හිමිකරුගේ යම් හැසිරීමක් මගින්,

හෝ දැනුම් දෙනු ලැබිය හැකි ය.

(2) දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් බන්ධනීය වන්නේ එය භාරගත් බව දැනුම්දීමක් මූලාරම්භක වෙත ලැබුණු පසුව පමණක් බවට මූලාරම්භක විසින් නියමයක් කරනු ලැබ තිබෙන අවස්ථාවක, එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය භාරගත් බවට දැනුම්දීමක් ඔහු වෙත එසේ ලැබී ඇත්නම් මිස, දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් එම සන්නිවේදනය මූලාරම්භක විසින් කිසිසේත්ම යවා නොමැති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය බන්ධනීය වන්නේ එය ලැබුණු බව දැනුම්දීමක් එහි මූලාරම්භක වෙත ලැබුණු පසුව පමණක් බවට එහි මූලාරම්භක විසින් නියමයක් කර නොමැත්තා වූ සහ නියමිත හෝ එකඟ වූ කාලය ඇතුළත එය භාරගත් බවට දැනුම්දීමක් මූලාරම්භක වෙත ලැබී නොමැත්තා වූ හෝ සාධාරණ කාලසීමාවක් ඇතුළත එවැනි කාලයක් නිශ්චිතව සඳහන් කර හෝ එම කාලය පිළිබඳව එකඟත්වයකට පැමිණ නොමැති අවස්ථාවක, එසේ භාරගත් බවට දැනුම්දීමක් තමා වෙත නොලැබුණු බව ප්‍රකාශ කරන හා එම භාරගත් බවට වූ දැනුම්දීම එවිය

යුතු සාධාරණ කාලයක් නිශ්චිතව සඳහන් කරන නිවේදනයක්, මූලාරම්භක විසින් ලිපිනය හිමිකරු වෙත යැවිය යුතු අතර, එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය භාරගත් එකී කාලසීමාව ඇතුළත දැනුම්දීමක් නොලැබුණහොත්, ලිපිනය හිමිකරු වෙත දැනුම්දීමෙන් අනතුරුව එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය කිසි දිනක යවනු නොලැබූ ලෙසට මූලාරම්භක විසින් සලකනු ලැබිය හැකි ය.

යවනු ලැබූ වේලාව හා ස්ථානය සහ ඉලෙක්ට්‍රොනික වාර්තා ලබාගැනීම.

14. (1) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟ වී ඇත්නම් මිස, දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් යැවීම, එය මූලාරම්භකගේ පාලනයෙන් බාහිර වූ තොරතුරු පද්ධතියකට ඇතුළු වූ විට හෝ එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය එහි මූලාරම්භකගේ පාලනය යටතේ පවත්නා තොරතුරු පද්ධතියකින් නැතහොත් මූලාරම්භක වෙනුවෙන් එය යැවූ පාර්ශ්වකරුගේ තොරතුරු පද්ධතියකින් නික්මී නොමැති නම් එම දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ලැබුණු වේලාවේ දී හෝ සිදු වන්නේ ය.

(2) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟ වී ඇත්නම් මිස, දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් ලැබුණු වේලාව පහත දැක්වෙන පරිදි නිශ්චය කළ යුතු ය. එනම් –

(අ) දත්ත පණිවුඩය ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදන ප්‍රතිග්‍රහණය කිරීමේ කාර්යය සඳහා ලිපිනය හිමිකරු යම් තොරතුරක් පද්ධතියක් නම් කර ඇත්නම්—

(i) දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය එම නම් කළ තොරතුරු පද්ධතියකට ඇතුළු වූ වේලාවේ දී එහි ප්‍රතිග්‍රහණය සිදුවන්නේ ය ; නැතහොත්

(ii) දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලොක්ට්‍රානික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය එම නම් කළ තොරතුරු පද්ධතිය නොවන ලිපිනය හිමිකරුගේ තොරතුරු පද්ධතියට යවනු ලැබුවහොත්, එම දත්ත පණිවුඩය,ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලොක්ට්‍රානික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ලිපිනය හිමිකරු විසින් ලබාගත් වේලාවේ දී එහි ප්‍රතිග්‍රහණය සිදුවන්නේ ය ;

(ආ) ලිපිනය හිමිකරු, නිශ්චිත කාල නියමයන් වෙතොත් ඒවාද සහිතව යම් තොරතුරු පද්ධතියක් නම්කර නොමැතිනම්, දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ලිපිනය හිමිකරුගේ තොරතුරු පද්ධතියකට ඇතුළු වූ වේලාවේ දී එහි ප්‍රතිග්‍රහණය සිදු වන්නේ ය.

(3) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු අතර අන්‍යාකාරව එකඟවී ඇත්නම් මිස, දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය, මූලාරම්භකගේ ව්‍යාපාර ස්ථානය පිහිටි ස්ථානයෙන් යවනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, ලිපිනය හිමිකරුගේ ව්‍යාපාර ස්ථානය පිහිටි ස්ථානයේ ප්‍රතිග්‍රහණය කළ ලෙස සැලකිය යුතු ය.

(4) තොරතුරු පද්ධතිය පිහිටා තිබෙන ස්ථානය දත්ත පණිවුඩය, ඉලෙක්ට්‍රොනික ලේඛනය, ඉලෙක්ට්‍රොනික වාර්තාව හෝ වෙනත් සන්නිවේදනය ප්‍රතිග්‍රහණය කරනු ලැබූ ලෙස (3) වන උපවගන්තිය යටතේ සැලකෙන ස්ථානයෙන් වෙනස් වන අවස්ථාවක වුව ද එය නොතකා (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) මූලාරම්භකගේ හෝ ලිපිනය හිමිකරුගේ හෝ ව්‍යාපාර ස්ථාන එකකට වැඩි ගණනක් ඇත්නම් ඉන් ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ඔහුගේ ව්‍යාපාරය ස්ථානය විය යුතු ය ;

(ආ) මූලාරම්භකගේ හෝ ලිපිනය හිමිකරුගේ හෝ ව්‍යාපාර ස්ථානයක් නොමැතිනම්, ඔහුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ඔහුගේ ව්‍යාපාර ස්ථානය විය යුතු ය ;

(ඇ) සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට "සාමාන්‍ය පදිංචි ස්ථානය" යන්නෙන්, එය ලියාපදිංචි කර ඇති යම් ස්ථානයක් අදහස් වේ ;

(ඈ) මූලාරම්භක සහ ලිපිනය හිමිකරු එකිනෙකට වෙනස් කාල කළාප තුළ වේ නම් වේලාව යන්නෙන් විශ්ව සම්මත වේලාව අදහස් වේ.

එකඟත්වය මගින් විචලනය.

**15**. ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර, දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් සන්නිවේදන ජනනය, යැවීම, ලැබීම, ආචයනය හෝ අන්‍යාකාරව සැකසුම් කිරීම පිළිබඳව වන, III වන පරිච්ඡේදයේ විධිවිධානවලට අදාළ, එකී එකඟ වනු ලැබිය හැකි කාරණා, අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

සහතික කිරීමේ සේවා සැපයුම් කරුවන්ගේ බැඳීම්.

**16**. (1) ජාල සේවා සැපයුම්කරුවකු විසින් හුදෙක් ප්‍රවේශය පමණක් සපයන, දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික ලේඛන, ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ වෙනත් සන්නිවේදනවල ස්වභාවයේ තෘතීය පාර්ශ්වික කරුණු හා සම්බන්ධව මේ පනත යටතේ වූ යම් ගණුදෙනුවක් සඳහා සිවිල් හෝ සාපරාධී බැඳීමකට පදනම් වී ඇත්තේ—

(අ) ඒ තොරතුරු නිර්මාණය කිරීම, පළ කිරීම, විසුරුවා හැරීම හෝ බෙදා හැරීම මත නම් හෝ ඒ කරුණුවල තිබෙන ප්‍රකාශයක් මත නම් ; හෝ

(ආ) ඒ තොරතුරු හෝ ඒ තොරතුරු හා සම්බන්ධව පවත්නා යම් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් මත නම්,

ඒ තොරතුරු සම්බන්ධයෙන් සහතික කිරීමේ සේවා සැපයුම්කරු එම සිවිල් හෝ සාපරාධී බැඳීමට යටත් නොවන්නේ ය.

(2) මේ වගන්තියේ අන්තර්ගත කිසිවකින් —

(අ) ගිවිසුමක් මත පදනම් වූ බැඳීමක් ;

(ආ) බලපත්‍රයක් යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිට වූ නියාමක පාලනයක් යටතේ හෝ සහතික කිරීමේ සේවා සැපයීමේදී එම සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකුගේ බැඳීමක් ; හෝ

(ඇ) යම් තොරතුරක් ඉවත් කිරීම, ඒ තොරතුරට ප්‍රවේශවීම අවහිර කිරීම හෝ ප්‍රවේශය සැපයීම ප්‍රතික්ෂේප කිරීම සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පැනවෙන නැතහොත් අධිකරණයක් විසින් පනවන යම් බැඳීමක්,

කෙරෙහි බලපෑමක් ඇති නොවිය යුතු ය.

සැක දුරුකිරීම.

**17**. සැක දුරුකිරීම පිණිස පහත සඳහන් පරිදි ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අර්පණයක් කිරීම සහ එය ප්‍රතිග්‍රහණය කිරීම සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ඉලෙක්ට්‍රොනික වාර්තාවක් මගින් ප්‍රකාශ කරනු ලැබුවහොත්, ඒ ඉලෙක්ට්‍රොනික වාර්තාවෙහි ඇති, නැතහොත් තර්කානුකූලව එම ඉලෙක්ට්‍රොනික වාර්තාවට ආබද්ධ ඉලෙක්ට්‍රොනික අත්සනක්, ඉලෙක්ට්‍රොනික අත්සනක් වීමේ හේතුව මතම පමණක්, එම ඉලෙක්ට්‍රොනික වර්තාවට නීතිමය බලපෑම අහිමි නොකළ යුතු ය.

(ආ) ගිවිසුමක් නිර්මාණය කර ගැනීම සඳහා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් යොදාගනු ලබන්නේ නම් එම කාර්යය සඳහා ඉලෙක්ට්‍රොනික වාර්තාව යොදා ගැනීමේ හේතුව මත ම පමණක් එම ගිවිසුමෙහි වලංගුභාවය හෝ එය බලාත්මක කිරීමේ හැකියාව හෝ අහිමිකරනු නොලැබිය යුතු ය ;

(ඇ) ගිවිසුම්වලට අදාළව අර්පණයක් ප්‍රතිග්‍රහණය කිරීම දැනුම් දීම සඳහා අර්පණකරු විසින් ක්‍රමයක් නියම කළ හැකි බවට වූ පිළිගත් පොදු නීතියේ සිද්ධාන්තය කෙරෙහි මේ පරිච්ඡේදයේ අන්තර්ගත කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය ;

(ඈ) ස්වයංක්‍රීයව පණිවුඩ පද්ධතියක් සහ ස්වාභාවික පුද්ගලයකු අතර නැතහොත් ස්වයංක්‍රීය පණිවුඩ පද්ධති අතර අන්තර්ක්‍රියා මගින් නිර්මාණය කරගත් ගිවිසුමක් අවසාන ගිවිසුමට හෝ අවසාන ස්වයංක්‍රීය පණිවුඩ පද්ධති අතර සිදු කර ගන්නා ලද එක් එක් ක්‍රියාවට ස්වාභාවික පුද්ගලයකුගේ සමාලෝචනයක් හෝ මැදිහත් වීමක් නොවීමේ හේතුවෙන් ම පමණක් ඒ ගිවිසුමක වලංගුභාවය හෝ එය බලාත්මක කිරීමේ හැකියාව අහිමි කරනු නොලැබිය යුතු ය.

## IV වන පරිච්ඡේදය

## සහතික කිරීමේ බලාධිකාරය සහ සේවා සැපයුම්කරුවන් ප්‍රතීතනය කිරීම

සහතික කිරීමේ බලාධිකාරයක් පත් කිරීම.

18. (1) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා නම් කරනු ලබන සහතික කිරීමේ බලාධිකාරයක් තිබිය යුතු ය.

(2) සහතික කිරීමේ බලාධිකාරයක් නම් කිරීමේ දී මේ පනතේ මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම භාර වන යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලයක්, ආයතනයක් හෝ අධිකාරියක් හෝ ඒවායේ යම් අංශයක් හෝ ඒකකයක් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය. එසේ නම් කරනු ලබන අදාළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව, රාජ්‍ය සංස්ථාව, ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලය හෝ අධිකාරිය විසින් ප්‍රතීත සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් විසින් සහතික කිරීමේ සේවා නිසි ලෙස ඉටු කිරීමේදී බවට වගබලා ගැනීමේ දී, මේ පනත යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමට අදාළව ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවට, රාජ්‍ය සංස්ථාවට, ව්‍යවස්ථාපිත පුද්ගල මණ්ඩලයට හෝ අධිකාරියට ඇති සමස්ත හැකියාව, ඒ නියමය කිරීමේ දී අමාත්‍යවරයා විසින් සැලකිල්ලට ගත යුතු ය.

සහතික කිරීමේ බලාධිකාරයේ බලතල.

19. සහතික කිරීමේ බලාධිකාරයට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් ප්‍රතීතනය කිරීම සඳහා පදනම් වන උපමාන සහ ඔවුන්ට තිබිය යුතු සුදුසුකම් හඳුනාගැනීම ;

(ආ) මේ පනතේ කාර්ය සඳහා අභියාචනා තීරණය කිරීම ප්‍රතීතන ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීමේ කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම ;

(ඇ) අවස්ථාවෝචිත පරිදි, 20 වන වගන්තිය යටතේ ප්‍රතීතනය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතීතනය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබූ අවස්ථාවක අභියාචන විභාග කිරීමේ කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම ;

(ඈ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට නියමිත සේවා සැපයීම පිළිබඳව බලපත්‍ර නිකුත් කිරීම හෝ වෙනත් යම් ආකාරයක බලයක් ලබාදීම ;

(ඉ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි යම් වාර්තා සහ රෙජිස්ටර පවත්වා ගන්නා ලෙස නියම කිරීම ; සහ

(ඊ) අවශ්‍ය විය හැකි පරිදි කලින් කල, සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීම සහ එම සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට විධාන නිකුත් කිරීම.

ප්‍රතීතන සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්.

**20**. (1) 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනත යටතේ වලංගු ප්‍රතීතන සහතිකයක් දරන්නේ නම් මිස, තමන් කිසිම තැනැත්තකු ප්‍රතීතන සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකු ලෙස ක්‍රියා නොකළ යුතු ය.

(2) ප්‍රතීතනය කරනු ලැබීමකින් තොරව, සහතික කිරීමේ සේවා සැපයීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින යම් සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකුගේ අයිතිවාසිකම්වලට, මේ පනතේ අන්තර්ගත කිසිවකින් බාධාවන ලෙස හෝ කිසිදු ආකාරයක සීමා කිරීමක් සිදු වන ලෙස තේරුම් නොගත යුතු ය.

(3) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකුට, 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පනතේ විධිවිධානවලට අනුකූලව සහ ප්‍රතීතනය සම්බන්ධයෙන් 19 වන වගන්තියේ (අ) ඡේදය යටතේ සහතික කිරීමේ බලාධිකාරය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන උපමානවලට එකඟවන පරිදි ප්‍රතීතන සහතිකය ප්‍රදානය කළ යුතු ය.

## V වන පරිච්ඡේදය

## සාක්ෂි කෙරෙහි බලපවත්වන රීති

සාක්ෂි පිළිබඳ රීති අදාළ වීම.

**21**. (1) සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් නීතියක හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධාන, මේ පනතේ කාර්යය සඳහා අදාළ විය යුතු ය.

(2) (අ) ප්‍රශ්න ගත යම් කරුණකට හෝ අදාළ කරුණට; සහ

(ආ) යම් ව්‍යාපාරයක්, වෙළෙඳාමක් හෝ වෘත්තියක් හෝ වෙනත් නිතිපතා සිදු කරනු ලබන කටයුත්තක් අතරතුර දී සාදන ලද, ලැබුණ හෝ ලබාගත්,

දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ සන්නිවේදනයක අන්තර්ගත යම් තොරතුරක් නීති කෘත්‍යයක දී ආවේශ්‍ය කරගත හැකි විය යුතු ය :

එසේ වුව ද, ඒ ප්‍රශ්නගත කරුණ හෝ ආදාළ කරුණ පිළිබඳ සෘජු වාචික සාක්ෂි තිබේ නම් එම සාක්ෂි ආවේශ්‍ය විය යුතු අතර, එම දත්ත පණිවුඩයේ, ඉලක්ට්‍රොනික ලේඛනයේ, ඉලෙක්ට්‍රොනික වාර්තාවේ හෝ වෙනත් සන්නිවේදනයේ අන්තර්ගත තොරතුරු විශ්වාසය තැබිය නොහැකි හෝ සාවද්‍ය බවට, විශ්වාස කිරීමට හේතුවක් නැති විය යුතු ය :

එසේම තවදුරටත් (අ) සහ (ආ) ඡේදවල කාර්ය සඳහා යම් දත්ත පණිවුඩයක්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙන්ත සන්නිවේදනයක් අන්තර්ගත තොරතුරක් ඉදිරිපත් කළ තැනැත්තකු-

(i) මියගිය තැනැත්තකු නම් හෝ ශාරීරික හෝ මානසික තත්ත්වය අනුව සාක්ෂිකරු ලෙස පෙනී සිටීමට අයෝග්‍ය තැනැත්තකු නම් ; හෝ

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු නම් සහ එම තැනැත්තා සෙවීම සඳහා සාධාරණ ලෙස පියවර ගෙන ඔහු සොයා ගැනීමට නොහැකි වූ තැනැත්තකු නම් ; හෝ

(iii) බිය නිසා සාක්ෂි දීමට අකමැති තැනැත්තකු නම ; හෝ

(iv) එසේ සාක්ෂි දීමෙන් වළක්වනු ලබන තැනැත්තකු නම්,

එම තොරතුරුවලට අදාළ සාක්ෂි ඇත්නම් එම සාක්ෂි ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, අධිකරණය විසින් දත්ත පණිවුඩයක, ඉලෙක්ට්‍රොනික ලේඛනයක්, ඉලෙක්ට්‍රොනික වාර්තාවක හෝ වෙනත් සන්නිවේදනයක අන්තර්ගත තොරතුරු සත්‍ය බවට පූර්ව නිගමනය කළ යුතු අතර යම් තැනැත්තකු විසින් නිර්මාණය කරන ලද දත්ත පණිවුඩයක් ඉලෙක්ට්‍රොනික ලේඛනයක් ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් සම්බන්ධයෙන් වන විට, එය නිර්මාණය කළ බවට උද්දේශිත තැනැත්තා විසින් එය නිර්මාණය කරනු ලැබ ඇති බව හා එමෙන්ම එහි ඇති යම් අත්සනක් හෝ විශේෂිත හඳුනාගැනීමේ ලකුණක් නිරවද්‍ය බවට ද පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අදාළ නොවන බව.

**22**. 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ අන්තර්ගත කිසිවකින් මේ පනතේ විධිවිධාන අදාළ වන කිසිදු දත්ත පණිවුඩයකට, ඉලෙක්ට්‍රොනික ලේඛනයකට, ඉලෙක්ට්‍රොනික වාර්තාවකට හෝ වෙනත් සන්නිවේදයක් සහ ඒ පණිවුඩයක්, හෝ ලේඛනයක් හෝ වාර්තාවක් හෝ වෙනත් සන්නිවේදනයක් සම්බන්ධයෙන්, අදාළ නොවන්නේ ය.

## VI වන පරිච්ඡේදය

## විවිධ විධිවිධාන

පනත අදාළවීම පිළිබඳ සීමා කිරීම.

**23**. මේ පනතේ විධිවිධාන මෙහි පහත සඳහන් කිසිවකට අදාළ නොවන්නේ ය. එනම් :—

(අ) අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීම හෝ ලියා සහතික කිරීම හෝ කවර නාමයකින් හෝ හැඳින්වෙන වෙනත් යම් තෙස්තමේන්තු නියාදනයකට ;

(ආ) 1991 අංක25 දරන විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විදුලි සංදේශ පද්ධතියක් සඳහා වූ බලපත්‍රයකට ;

(ඇ) (82 වන අධිකාරය වූ) විනිමය බිල්පත් ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි වූ නීතිමය බිල්පත්‍රයකට ;

(ඈ) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතේ 2 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි වූ ඇටෝර්නි බලපත්‍රයකට ;

(ඉ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ අනුමිත ව්‍යංජිත ප්‍රතිඵලීය භාරයක් කෙරෙහි ;

(ඊ) යම් නිශ්චල දේපළක් හෝ ඒ දේපළකට ඇති යම් සම්බන්ධතාවයක් විකිණීම හෝ පවරාදීම සඳහා වූ ගිවිසුමකට ; හෝ

(උ) 24 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගයක නිශ්චය කොට දැක්වෙන වෙනත් යම් ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට,

අදාළ නොවන්නේ ය.

නියෝග.

**24**. (1) නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් හෝ 2 වන වගන්තියේ නිශ්චය කොට දැක්වෙන පරිදි මේ පනතේ අරමුණු ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ අමාත්‍යවරයා විසින්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විමසා නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මෙහි පහත දැක්වෙන සියලු කාරණා හෝ යම් කාරණයක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) (i) අමාත්‍යාංශවල, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, පුද්ගල මණ්ඩලවල හා ආණ්ඩුවට සහ ව්‍යවස්ථාපිත ආයතනවලට අයත්, ආණ්ඩුව හා ව්‍යවස්ථාපිත ආයතන විසින් පාලනය කරනු ලබන නියෝජිත ආයතනවල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්ව සුරක්ෂිත වූ ද ;

(ii) හැකි උපරිම ප්‍රමාණය දක්වා අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය සහිත වූ ද,

ඉලෙක්ට්‍රොනික යටිතල පහසුකම් සහ මාර්ගෝපදේශ නිශ්චය කොට දැක්වීම ;

(ආ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළව, සහතික කිරීමේ බලාධිකාරයේ සාමාජිකයන්ගේ සේවා කොන්දේසි ;

(ඇ) 18 වැනි වගන්තිය ප්‍රකාර සහතික කිරීමේ බලාධිකාරය ලෙස පත්කරනු ලබන තැනැත්තාගේ, පුද්ගල මණ්ඩලයේ හෝ ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය සහ ඔවුන්ට අදාළ වන වෙනත් නියමයන් හා කොන්දේසි ;

(ඈ) 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් ප්‍රතීතනය සඳහා උපමාන, ඒවායේ ක්‍රිප්ටොග්‍රැපික සේවා, ඉලෙක්ට්‍රොනික අත්සන් හෝ වැඩිදියුණු කළ ඉලෙක්ට්‍රොනික අත්සන සහ ආරක්ෂක ක්‍රියාමාර්ග හා සම්බන්ධිත යම් නීතිමය ආනුෂංග සඳහා උපමාන ;

(ඉ) ප්‍රතීතන සහතිකයක් අලුත් කිරීම, නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට එරෙහි අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය ;

(ඊ) සහතික කිරීමේ සේවා සැපයීමට ඉදිරිපත් වන තැනැත්තන්ට තිබිය යුතු සුදුසුකම් ;

(උ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් පිළිගැනීම, එම සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ ඔවුන් විසින් සැපයිය යුතු සේවා වර්ග ;

(ඍ) සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් විසින් පවත්වා ගත යුතු වාර්තා සහ එම සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් විසින් සහතික කිරීමේ බලාධිකාරය වෙත තොරතුරු සැපයිය යුතු ආකාරය ;

(එ) 15 වැනි වගන්තියේ සඳහන් කර ඇති කරුණු පිළිබඳ.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට, එය යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) ඒ නියෝග එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**25**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අර්ථ නිරූපනය.

**26**. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ කාර්ය සඳහා–

"ලිපිනය හිමිකරු" යන්නෙන්, සන්නිවේදනයක් ප්‍රතිග්‍රහණය කිරීමට එහි මූලාරම්භක විසින් අරමුණු කළ තැනැත්තා අදහස් වන නමුත්, අතරමැදියකු ඊට ඇතුළත් නොවේ,

"සහතික කිරීමේ බලාධිකාරය" යන්නෙන්, පනතේ IV වන කොටස ප්‍රකාර පත්කරනු ලැබූ සහතික කිරීමේ බලාධිකාරය අදහස් වේ,

"සහතික කිරීමේ සේවා" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් තොරතුරු යවන්නන් හෝ එම තොරතුරු ආචයනය කර තබාගන්නන් සහ ප්‍රතිග්‍රාහකයන් සඳහා සැපයෙන්නා වූ ද එම තොරතුරුවල රහස්‍යභාවය, සත්‍යතාවය සහ අවංකභාවය සුරක්ෂිත වී ඇති බව නිශ්චය කිරීමේ කාර්යය සඳහා ක්‍රිප්ටොග්‍රැපික් තාක්ෂණ ක්‍රම යොදාගැනීමට පහසුකම් සැලසීම සඳහා සැලසුම් කරනු ලැබුවා වූ ද යම් සේවයක් අදහස් වේ ;

"සහතික කිරීමේ සේවා සැපයුම්කරු" යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව සහතික කිරීමේ සේවා සපයන තැනැත්තෙක් අදහස් වේ ;

"සන්නිවේදනය" යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව යම් ඉලෙක්ට්‍රොනික ගනුදෙනුවක් හා සම්බන්ධව යම් තැනැත්තකු විසින් කළ යුතුව තිබෙන හෝ තෝරාගත යුතුව තිබෙන අර්පණයක් කිරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම ඇතුළුව, යම් ප්‍රකාශයක්, ප්‍රකාශනයක්, තරයේ ඉල්ලා සිටීමක්, නිවේදනයක් හෝ ඉල්ලීමක් අදහස් වේ ;

"පරිගණකය" යන්නෙන්, තොරතුරු සැකසුම් හැකියාව සහිත ඉලෙක්ට්‍රොනික හෝ ඒ හා සමාන උපක්‍රමයක් අදහස් වේ ;

"දත්ත පණිවුඩය" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික, චුම්බක, දෘෂ්ටික හෝ වෙනත් ඒ සමාන උපක්‍රමයක් මගින් උත්පාදනය කළ, යැවූ, ප්‍රතිග්‍රහණය කළ, හෝ ගබඩා කළ තොරතුරක් අදහස් වේ ;

"ඉලෙක්ට්‍රොනික" යන්නෙන්, මාධ්‍යය කවරක් වුවද ඉලෙක්ට්‍රොනික, චුම්බක, දෘෂ්ටික හෝ වෙනත් ඒ සමාන ශක්තීන් මගින් උත්පාදනය කරන, යවන, ප්‍රතිග්‍රහණය කරන හෝ ගබඩා කරන තොරතුරු අදහස් වේ ;

"ඉලෙක්ට්‍රොනික ලේඛනය" යන්නට, ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන ලේඛන, වාර්තා, තොරතුරු, සන්නිවේදන හෝ ගනුදෙනු ඇතුලත් වේ ;

"ඉලෙක්ට්‍රොනික වාර්තාව" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික උපක්‍රමයක් මගින් නිර්මාණය කළ, ගබඩාකළ, උත්පාදනය කළ, ප්‍රතිග්‍රහණය කළ හෝ සන්නිවේදනය කළ ලියවිල්ලක් හෝ වෙනත් වාර්තාවක් අදහස් වේ ;

"ඉලෙක්ට්‍රොනික අත්සන" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ලේඛනයක සත්‍යවත්භාවය හෝ අවංකභාවය හෝ ඒ දෙකම තහවුරු කිරීම පිණිස ඉලෙක්ට්‍රොනික ලේඛනයක් සැබෑ බවට සහතික කිරීමේ සහ, හෝ එය අනුමත කිරීමේ චේතනාවෙන් ඉලෙක්ට්‍රොනික ලේඛනයකට යොදන, ඒකාබද්ධ කරන හෝ තර්කානුසාරීව ඒ හා සම්බන්ධ වන ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වූ යම් අක්ෂර, අංක, සංකේත, ප්‍රතිබිම්බ, විශේෂිත ලකුණු හෝ ඒවායේ සම්මිශ්‍රණයක් අදහස් වේ ;

"තොරතුරු" යන්නට, විෂයය කේතයක් සහ ප්‍රභව කේතයක් ඇතුළුව පාඨයක්, පණිවුඩයක්, දත්තයක්, කටහඬක්, ශබ්දයක්, දත්ත සමුදායක්, වීඩියෝ, සංඥා, මෘදුකාංග, පරිගණක ක්‍රමලේඛ ඇතුළත් වේ ;

"තොරතුරු පද්ධතිය" යන්නෙන්, තොරතුරු නිර්මාණය උත්පාදනය, යැවීම, ලැබීම, ආචයනය, ප්‍රතිනිෂ්පාදනය, ප්‍රදර්ශනය, වාර්තාගත කිරීම හෝ පිරිසැකසුම සඳහා වූ ඉලෙක්ට්‍රොනික පද්ධතියක් අදහස් වේ ;

"අතරමැදියා" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය යැවීම, ප්‍රතිග්‍රහණය, ආචයනය හෝ සැකසුම හෝ ඊට අදාළව වෙනත් සේවා සම්පාදනය හා සම්බන්ධව වෙනත් තැනැත්තකු වෙනුවෙන් සේවා සැපයුම්කරුවකු ලෙස ක්‍රියා කරන තැනැත්තෙක් අදහස් වේ ;

"ජාල සේවා සැපයුම්කරු" යන්නෙන්, පොදු "ස්විච්චිගත" ජාලයක් අයිති, එම ජාලයක සන්තකය දරන, එම ජාලයක්, මෙහෙයවන, පාලනය කරන හෝ කළමනාකරණය කරන නැතහොත් විදුලි සංදේශ සේවා සපයන තැනැත්තෙක් අදහස් වේ ;

"මූලාරම්භක" යන්නෙන්, සන්නිවේදනය ප්‍රතිග්‍රහණයට පෙරාතුව හෝ ආචයනය කරනු ලැබීමක් වූයේ නම් ඊට පෙරාතුව, එය යැවූ බවට හෝ උත්පාදනය කළ බවට යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් උද්දේශනය කෙරේ ද, ඒ තැනැත්තා අදහස් වන නමුත් ඒ සන්නිවේදනය සම්බන්ධයෙන් අතරමැදියකු ලෙස ක්‍රියාකළ තැනැත්තෙක් ඊට ඇතුළත් නොවේ ;

"ප්‍රවේශය සැපයීම" යන්න, තෘතීය පාර්ශ්වික කරුණු සම්බන්ධව අදාළ වන විට, තෘතීය පාර්ශ්වික කරුණුවලට ප්‍රවේශ වීමට අවශ්‍ය වන කාර්මික විධික්‍රම සපයාදීම අදහස් වන අතර ප්‍රවේශය ලබා දීමේ කාර්ය සඳහා තෘතීය පාර්ශ්වික කරුණු ස්වයංක්‍රීය හෝ තාවකාලික ලෙස ආචයනය ද ඊට ඇතුළත් වේ ;

"ආරක්ෂක කාර්ය පටිපාටිය" යන්නෙන්, සහතික කිරීමේ සේවා සැපයුම්කරුවකු නිකුත් කළ සහතිකයක් සම්බන්ධව, යම් ඉලෙක්ට්‍රොනික ලේඛනයක සත්‍යතාව හෝ අවංකභාවය හෝ ඒ දෙකම හෝ තහවුරු කිරීම සඳහා වූ සැපයුම්කරුගේ සහතික කිරීමේ පරිචය පිළිබඳ ප්‍රකාශයේ නිශ්චිතව සඳහන් වන, "අල්ගොරිතම" හෝ කේත, හඳුනාගැනීමේ වචන හා අංක, "එන්ක්‍රිප්ෂන්", ප්‍රතිඋත්තරදීමේ හෝ ලැබුණු බව දැන්වීමේ ක්‍රියාමාර්ග, මෘදුකාංග, දෘඩාංග හෝ ඒ සමාන ආරක්ෂක උපක්‍රම අවශ්‍ය විය හැකි කාර්ය පටිපාටියක් අදහස් වේ;

"තෘතීය පාර්ශ්වය" යන්න, ජාල සේවා සැපයුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, එම සේවා සැපයුම්කරුගේ සක්‍රීය පාලනයක් බලනොපවත්වන තැනැත්තෙක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.